# පාසල් වාරසටහන 2024

## පුරවැසි අධ්‍යාපනය

## 07 ශ්‍රේණිය

උතුරුමැද පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පළමුවන වාරය

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද ගණන | යෝජිත දිනය | නිමකළ දිනය | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|---|---|
| **අපේ පවුල**<br>7.1 යුතුකම් හා වගකීම් ඉටු කිරීම මගින් පවුලේ සාමාජිකයන් අතර යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා ගොඩනගා ගනියි. | 7.1.1 සමාජයක කුඩා ම සහ වැදගත් ම ඒකකය පවුල බව හඳුනා ගෙන යහපත් සාමාජිකයකු ලෙස ස්ථාවර පවුල් ඒකක ගොඩනගා ගැනීමට දායක වෙයි. | **පවුල**<br>• පවුල් වර්ග<br>- න්‍යෂ්ටික පවුල , විස්තෘත පවුල<br>• පවුල තුළ දක්නට ලැබෙන පොදු ලක්ෂණ<br>• පවුලේ සාමාජිකයකු වශයෙන් අපට ලැබෙන ප්‍රයෝජන | - පවුල යන සංකල්පය පැහැදිලි කරයි.<br>- තම පවුල පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරයි.<br>- පවුල් වර්ගවල වෙනස්කම් පැහැදිලි කරයි.<br>- පවුල දක්නට ඇති පොදු ලක්ෂණ ලැයිස්තුගත කරයි.<br>- පවුලේ සාමාජිකයෙකු ලෙස තමා අත් විඳින ප්‍රයෝජන විස්තර කරයි. | 02 | | | |
| | 7.1.2 පවුලේ සාමාජිකයෙකු වශයෙන්, නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගෙන, ඒවා ඉටු කර ගැනීමට කටයුතු කරයි. | • සාර්ථක දිවි පෙවෙතකට අරමුණක් තිබීමේ වැදගත්කම<br>• එම අරමුණ කරා යොමු වන පරිදි තම ක්‍රියා පටිපාටි ප්‍රමුඛතා අනුව මෙහෙය වීම<br>• විවිධ දෑ තුළින් තමන්ට උචිත දේ කෙරෙහි පමණක් යොමු වීම | - නිවැරදි ජීවන අරමුණක් යන්න පැහැදිලි කරයි.<br>- නිවැරදි ජීවන අරමුණු ගොඩනගා ගනියි.<br>- අරමුණක් සහිත ව ජීවත් වීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>- ජීවින අරමුණු ජය ගැනීමේ ක්‍රමවේද විස්තර කරයි.<br>- විවිධ ආකර්ෂණීය දේ මගින් ජීවිතයට වඩා උචිත දේ තෝරා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි. | 02 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 7.1.3 පවුලේ අනන්‍යතාව තහවුරු කර ගනිමින් ආත්මාභිමානය සංවර්ධනය කර ගනියි. | • තමා පිළිබඳව අභිමානයක් ඇති කර ගැනීමේ වැදගත්කම<br>• තම අනන්‍යතාව සහ ගරුත්වය තමා වෙත ම රැඳී තිබීම<br>• නිරතුරුව ම ආත්මාභිමානය හා අනන්‍යතාවය සුරැකීම<br>• පවුලේ සාමාජිකයෙකු ලෙස වර්ධනය කර ගත යුතු යහපත් ගුණාංග | - තම දක්ෂතා හා සුවිශේෂී ගති ලක්ෂණ ප්‍රකාශ කරයි.<br>- තම අනන්‍යතාව හා තමා පිළිබඳ අභිමානය ගොඩ නැගෙන ආකාරය පැහැදිලි කරයි.<br>- තම අනන්‍යතාව හා ගරුත්වය තමා විසින් ම රඳවා තබා ගත යුතු බවට අදහස් දක්වයි.<br>- ආත්ම අභිමානය හා අනන්‍යතාව රැක ගන්නා ආකාරය විස්තර කරයි.<br>- තම අනන්‍යතාව සුරැකීම සඳහා වර්ධනය කරගත යුතු ගුණාංග ලියා දක්වයි. | 02 | | | |
| | 7.1.4 පවුලේ සාමාජිකයින්ගේ ජීවිත සාර්ථකත්වයට හිතකර බලවේග අදාළ පරිදි උපයෝගි කර ගනිමින් අහිතකර බලවේවලින් වැලකීමට කටයුතු කරයි. | • සමාජයක පවත්නා හිතකර, අහිතකර බලවේග හඳුනා ගැනීම.<br>• අහිතකර බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන අයහපත් ප්‍රතිඵල විමර්ශනය කිරීම.<br>• හිතකර බලවේග නිසා සමාජය තුළ දක්නට ලැබෙන යහපත් ප්‍රතිඵල විමර්ශනය කිරීම<br>• හිතකර බලවේග ජීවිතයට ළ ං කර ගැනිම හා අහිතකර බලවේගවලින් ඈත් වීමට කටයුතු කිරීම | - හිතකර බලවේග හා අහිතකර බලවේග විස්තර කරයි.<br>- හිතකර බලවේගවල ප්‍රතිඵල අගය කරයි.<br>- අහිතකර බලවේගවලින් ලැබෙන අහිතකර ප්‍රතිඵල විස්තර කරයි.<br>- අහිතකර බලවේගවලින් මිදීමේ උපාය මාර්ග පැහැදිලි කරයි.<br>- හිතකර බලවේග ජීවිතයට සම්බන්ධ කර ගන්නා ආකාරය පැහැදිලි කරයි. | 02 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 7.1.5 පවුලේ සාමාජිකයන්ගේ පෞරුෂ සංවර්ධනය උදෙසා ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | ● සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල පවත්නා අගය<br>විනෝදය, වින්දනය, චිත්තවේග ප්‍රකාශනය, ජීවිතාවබෝධය<br>● විවේක අවස්ථාවල දී සංයමයෙන් යුක්ත ව නිර්මාණකරණයේ යෙදීම<br>● කාලය ඵලදායි ලෙස ගත කිරීම<br><br>● පවුලේ සාමාජිකයන් එක්ව එම අවස්ථා භුක්ති විඳීමට ඉඩ සලසා ගැනීම | - ක්‍රීඩාවෙන් හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වලින් ලැබෙන ප්‍රයෝජන පැහැදිලි කරයි.<br><br>- රසවින්දනයට යෝග්‍ය වන නිර්මාණ හා ක්‍රියාකාරකම් විස්තර කරයි. ----<br>- ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියා විවේකය ගත කිරීමට උචිත මාධ්‍ය බවට අදහස් දක්වයි.<br>- පවුලේ සාමාජිකයින් සමග ක්‍රීඩා හා සෞන්දර්යාත්මක ක්‍රියාකාරකම්වල නිරතවන අයුරු විස්තර කරයි.<br><br>නිර්මාණකරණයේ යෙදෙයි. | 03 | | | |
| | | මාසික පරීක්ෂණය - මාර්තු මාසය | | 01 | | | |
| | 7.1.6 පවුලේ සාමාජිකයකු වශයෙන් මුහුණපාන ගැටලු හා අභියෝග හමුවේ, විචාරශීලී හා නිර්මාණශීලී චින්තනයෙන් යුතු ව කටයුතු කරයි. | ● එදිනෙදා ජීවිතයේ දී ඕනෑ ම පුද්ගලයෙකුට විවිධ අභියෝගවලට මුහුණ පෑමට සිදු වන බව<br>● ජීවිත අවස්ථා හා අභියෝග හමුවේ උපක්‍රමශීලි ව මෙන් ම නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු කිරීම<br>● චිත්තවේග පාලනයෙන් යුතු ව කටයුතු කිරීම හා එහි වැදගත්කම<br>● වෙනස් වන වෙළෙඳපොල තත්ත්ව හමුවේ විචාරශිලී ව හා බුද්ධිමත් පාරිභෝගිකයෙකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරයි. | - පවුලේ සමාජිකයෙකු ලෙස තමා මුහුණපාන ගැටලු හා අභියෝග විස්තර කරයි.<br>- අභියෝග හමුවේ උපක්‍රමශීලි ව, නිර්මාණශීලී ව හා විචාරශීලී ව කටයුතු කරන ආකාර පැහැදිලි කරයි.<br>- විවිධ චිත්තවේග නම් කරයි.<br>- චිත්තවේග පාලනය කළ යුතු ආකාර පහදයි.<br>- බුද්ධිමත් හා විචාරශීලී පාරිභෝගිකයකු ලෙස කටයුතු කිරීමේ වැදගත්කම විස්තර කරයි. | 02 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 7.1.7 පවුලේ යහපැවැත්ම සඳහා වැඩ ලෝකයේ වැදගත්කම සහ පවුලේ ආදායම් පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කර ගනියි. | ● පවුලකට මූල්‍යමය සුරක්ෂිතභාවයේ අවශ්‍යතාව, බොහෝ විට මව්පිය දෙදෙනාගේ එක් අයෙකු හෝ දෙදෙනා ම රැකියාවේ නිරත වෙමින් ආදායම් සපයා ගැනීම | - දිනපතා/සතිපතා/මාසික ව හොඳ ආදායමක් ලැබීමේ හෝ අඩු ආදායමක් ලැබීමේ ප්‍රතිඵල සාකච්ඡා කරයි<br>- දෙමාපියන්ගේ රැකියා අහිමි වීම පවුලකට බලපාන ආකාරය විමර්ශනය කරයි.<br>- නව රැකියාවක් ආරම්භ කිරීමේ දී හෝ සොයා ගැනීමේ දී වෙනත් ප්‍රදේශයක ජීවත් වීමට සිදු වීම නිසා ඇති වන ආතතිය පිළිබඳ විස්තර කරයි.<br>- දෙමාපිය දෙදෙනා ම රැකියාවේ නිරත වීම නිසා නූතන පවුල් ජීවිතයට ඇති කරන පීඩනය පිළිබඳ සාකච්ඡා කරයි. | 02 | | | |
| | 7.1.8 පවුලේ සාමාජිකයෙකු ලෙස තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් යුතුකම් ඉටු කරමින් විනයගරුක ව ජීවත් වීමට අවශ්‍ය මානව ගුණධර්ම වර්ධනය කර ගනියි. | ●පවුලේ සාමාජිකයන්ගේ අයිතිවාසිකම්, යුතුකම් හා වගකීම්<br>● පවුල තුළින් බිහිවන යහපත් පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග | - පවුලෙන් තමා ට හා තමාගෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් හා වගකීම් ප්‍රකාශ කරයි.<br>- අයිතිවාසිකම් භුක්ති විඳින අතර ඒ හා බැඳුණු යුතුකම් ඉටු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරයි.<br>- පවුලක් ලෙස සාමූහික ව කටයුතු කරන ආකාරය පැහැදිලි කරයි.<br>- යහපත් පුරවැසියකු වීමට අවශ්‍ය ගුණාංග පවුල තළින් ලැබෙන ආකාරය විස්තර කරයි. | 01 | | | |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | 7.1.9 පවුල හා අසල්වාසීන් අතර අන්‍යෝන්‍ය සබඳතා තහවුරු කර ගෙන සහජීවනයෙන් ජීවත් වීමට හුරු වෙයි. | • පවුලේ සාමාජිකයන් සහ ඥාතිත්වය<br>• තම සමීප ඥාතීන් හැඳින්වීම සඳහා භාවිත කරන ඇමතුම් පද<br>• විවිධ ප්‍රදේශවල ඥාතිත්වය සඳහා භාවිත කරන ඇමතුම් පද වෙනස් වන බව<br>• පවුල තුළ ක්‍රියාත්මක වන සිරිත් විරිත්, සම්ප්‍රදායන් හා ඇගයීම් පද්ධතිය<br>සිරිත්විරිත් , සම්ප්‍රදායන්<br>• පවුල හා ඥාතීන් අතර පවත්නා සබඳතා<br>• පවුල හා අසල්වාසීන් අතර පවත්නා සබඳතාවල වැදගත්කම | - පවුලේ සාමාජිකයන් හා ඥාතිත්වය විස්තර කරයි.<br>- ඥාතිත්වය සඳහා විවිධ ප්‍රදේශවල භාවිත වන ඇමතුම් පද පිළිබඳ සාකච්ඡා කරයි.<br>- යහපත් ඥාති සම්බන්ධතා ගොඩනගා ගැනීමේ වැදගත්කම පැහැදිලි කරයි.<br>- පවුල තුල ක්‍රියාත්මක සිරිත්විරිත් හා සම්ප්‍රදායන් ලියා දක්වයි.<br>- තම පවුල වටා ජීවත් වන සෙසු පවුල් ඒකක අසල්වාසීන් බව ප්‍රකාශ කරයි.<br>- අසල්වාසීන් සමග යහපත් සබඳතා ගොඩ නගා ගැනීම සමාජ පැවැත්මට අත්‍යවශ්‍ය බව පැහැදිලි කරයි. | 01 | | | |
| | | මාසික පරීක්ෂණය - අප්‍රේල් මාසය | | 01 | | | |
| | | පළමු වාර පරීක්ෂණය | | | | | |